# සැනික්ටා 15 නිකුතුව

මෙම සටහන සැනික්ටා, ෆෙඩොරා සහ හන්තාන 15 පද්ධති මත ඇති Gnome 3 භාවිතය සඳහා උපකාරී වනු ඇත. වැඩතල යෙහි ඇතුලත් යතුරු සංයෝග (keybindings), ඇද අතහැරීමේ හැකියාව, සහ විශේෂ උපයෝග වැනි පහසුකම් ගැන සැකෙවින් විස්තර සහිතය.

# වැඩතලය මත

යෙදවුම් අතර හුවමාරු වීමට **Alt+Tab** යතුරු සංයෝජනය භාවිත කල හැක. ඒවා අතර මාරු වීමේදී බහු කවුළු සමග යෙදවුම් වල කවුළු පෙරදසුන් දර්ශනය වනු ඇත. පෙරදසුන් මද පමාවකින් පසු දර්ශනය වනු ඇත. නමුත් ඔබ Down arrow යතුර තද කලහොත් එසැනින් දිස්වනු ඇත. Left සහ Right Arrow යතුරු මගින් හෝ මවුස් පොයින්ටරය මගින් ඔබට පෙරදසුන් කවුළු අතර මාරු වීමට පුලුවන.




**Alt+[** ***Tab*** යතුරට ඉහළ යතුර**]** (උදා: **Alt+`** US English ආකෘතියේ යතුරු පුවරුවකදී) එක් යෙදුමකට අදාල

කවුළු අතර සීරුමාරු කරයි. උදාහරණයක් ලෙස ඔබ LibreOffice හරහා ලිපි දෙකක් විවෘත කර ඇත් නම් එම කවුළු දෙක අතර සීරුමාරු වීමට මෙම යතුරු යුගලය අවශ්‍ය වනු ඇත. ඉහත උදාහරණයේ Firefox වෙබ්ගවේශකය දෙවරක් විවෘතව ඇති විටෙක Alt+` මඟින් දිස්වෙන අයුරු දැක්වේ.

වෙනත් වැඩල තුළ ක්‍රියාත්මක යෙදුම් සිරස් බෙදූමකට පසුව දිස්වේ.  එමෙන්ම Alt+Tab මඟින් කාර්යයන් අතරේ ඉතා පහසුවෙන් සීරුමාරු වීමට සහ ක්‍රියාත්මක වන යෙදුම් වල සම්පූර්ණ දසුනක් පරිශීලකයාට ලබා දේ.




කවුළු විශාල කිරීම සහ ටයිල් කිරීම **(Window maximizing and tiling)**:

ඔබේ පද්ධතියේ විශේෂිතව වෙනස් කම් සිදු කර ඇති නිසා විශාල කිරීමට සහ කිරීමට සුපුරුදු ලෙසටම කවුළුවල ඉහළ දකුණු කෙලවරේ අදාල බොත්තම් දැකිය හැක වේ. මීට අතරව විශාල කිරීම සඳහා කවුළුව වැඩතලයේ ඉහළ මායිමට ඇද දැමීමෙන් හෝ දෙවරක් කවුළුවේ සිරස්තලය මත දෙවරක් ක්ලික් කරන්න,



එමෙන්ම කුඩා කිරීම සඳහා පහළට ඇද දමන්න.  එමෙන්ම තිරය වම් සහ දකුණු මායිම් වෙත ඇද දැමීම මඟින් පැත්තට ටයිල් කළ හැක.

**Alt+F2** මඟින් යෙදුමක් ඇරඹීම සඳහා විධානයන් ලබා දීමට අවස්ථාව සලසයි.




# පැනලය

දළ දැක්ම (Overview) සඳහා පිවිසීමට Activities බොත්තම, ඉලක්කගත යෙදූමේ නම, දිනය, දැනුම් දීමේ අයිකන, පරිශීලක නාමයෙන් යුත් පරිශීලක මෙනුව සක්‍රීය කරන බොත්තම යනාදිය පැනලය සතුව ඇත. පැනලය මත ඇති දිනය මත ක්ලික් කළ විට දිනදර්ශනය දිස් වේ. එමෙන්ම පරිශීලක මෙනුව සතුව පද්ධති අභිප්‍රේත (System Preferences), ඉවත් වීම (Log Out) සහ වසා දැමීම(Shut Down) යන විකල්ප ඇත.



පද්ධතිය වසා දැමීම (shutdown) සඳහා තිරයේ ඉහළ වම් කෙලවරේ දිස්වෙන පරිශීලක නාමය මත ක්ලික් කරන්න. ඉන්පසු දිස්වෙන මෙනුවේ පහල ඇති **Power Off...** යන්න ක්ලික් කරන්න.




# <u>දළ දැක්ම වෙත හා එහි සිට මාරුවීම</u>

**හොට් කෝනර් (Hot corner)** - ඉහළ වම් කෙළවරට මවුසය ගෙනයෑමෙන් ඔබට දළ දැක්මට හෝ දළදැක්මේ සිට වැඩතලයට පැමිණිය හැක

**ක්‍රියාකාරීත්ව බොත්තම** - ඉහළ වම් කෙළවරේ ක්‍රියාකාරීත්ව බොත්තමද ඔබව වැඩතලයේ සිට දළ දැක්මට හෝ දළ දැක්මේ සිට වැඩතලයට ගෙනයයි.

**පද්ධති (කවුළු) යතුර හෝ Alt+F1 –** මෙම යතුරු සංයෝග ඔබව වැඩතලයේ සිට දළ දැක්මට හෝ දළ දැක්මේ සිට වැඩතලයට ගෙනයයි.




## <u>දළ දැක්ම තුළදී</u>

**ඩෑශය (dash)**, ඔබේ ප්‍රියතම යෙදුම් හා ඔබේ ක්‍රියාත්මක වන යෙදුම් මෙහි දැක්වේ. යෙදුම් අයිකනයට පසුපසින් දිලිසීම එය ධාවනය වන බව පෙන්වයි.

**යෙදුමෙ අයිකනය මත ක්ලික් කිරීම**, එම යෙදුම ක්‍රියාත්මක කරවයි. තවද දැනට යෙදුම ධාවනය වේ නම් එය අවසන් වරට භාවිත කවුළුවේ විවෘත කරයි.

**යෙදුම් අයිකනය මත මධ්‍ය ක්ලික් කිරීම** එය නව වැඩබිම ආරම්භ කරවයි.

**යෙදුම් අයිකනය මත දකුණු ක්ලික් කිරීම,** ධාවනය වන යෙදුමකදී එක් කවුළුවක් තෝරාගැනීම සඳහා කවුළු ලැයිස්තුවක් පෙන්වයි. තවද මෙම මෙනුවේ එම යෙදුමෙහි තවත් කවුළුවක් නිර්මාණයට හෝ එය ප්‍රියතම ලැයිස්තුවට එක් කිරීමට අභිප්‍රේත ලබාදෙයි.




**යෙදුම් අයිකනය මත Ctrl+ක්ලික් කිරීමෙන්**, ධාවනය වන යෙදුමක් වත්මන් වැඩතලයේ නව කවුළුවක විවෘත වේ.

**ඩෑශය තුළ යෙදුම් අයිකනය ඇද දැමීම එහි ස්ථානය වෙනස් කරයි.** ඇදීමේදී ඩෑශය පහළින් ඉවතලන බඳුන් අයිකනයක් ලැබේ. ඔබ යෙදුම් අයිකනය එය මතට ඇද දැමුව හොත් එය ඩෑශයෙන් ඉවත්වේ.



**යෙදුම් අයිකනයක් නිශ්චිත වැඩබිමකට ඇදදැමීම,** එම යෙදුමේ නව කවුළුවක් ඇදදැමූ වැඩබිමෙහි විවෘත කරයි. ක්ලික් කර ආරම්භ කිරීමේදී දළදැක්මෙන් ඉවත් වන නමුත් ඇද දමා ආරම්භ කිරීමේදී දළ දැකුම් ප්‍රකාරයෙන් ඉවත් නොවේ.

**සෙවුම් කොටුව යෙදුම් නම් වලින් හෝ ඒවායේ විස්තරයෙන් සෙවීමට ඉඩ දෙයි.** තවද එය සතුව අභිප්‍රේත ඇප්ලට සඳහාද ඉඩක් ඇත. ඔබ දළදැක්ම තුළ සිටින විට සෙවුම් කොටුව ස්වයංක්‍රියව නාභිගතවන නිසා ඔබට සරලව ලිවිය හැක. සෙවුම් ප්‍රතිපල තුළ ඉහළ පහළ යෑමට ඊතල යතුරු භාවිත කලහැකියි.

**සියළු විවෘත කවුළු ඒවායේ අදාල වැඩබිම් වල දිස්වේ.** ඔබට කවුළුව වෙත මාරුවී දළ දැක්ම හැරදැමීමට එය මත ක්ලික් කර හැක. ඔබට දළදැක්ම හැරදමා වැඩබිමකට මාරුවීමට වැඩබිමක් මත ක්ලික් කිරීමෙන් හැක. නිශ්චිත කවුළුවක් තෝරාගැනීමෙන් තොරව වැඩබිමකට මාරුවීමේදී එය ඔබ අවසන් වරට භාවිත කල පිළිවෙළට දිස්වනු ඇත.

**නිශ්චිත කවුළුවක් මත සිරස් ස්ක්‍රෝල් කිරීම** එය විශාලනය කරයි

**කවුළු වැඩබිම් අතර ඇද දැමිය හැක**, වැඩබිම් ගතිකව එක්වන අතර ඇවැසි ලෙස ඉවත්වේ. සැමවිටම අමතර වැඩබිමක් පවතී.

**Ctrl+Alt+Tab** පිවිසුම් සහායක ස්විචය ඉදිරියට ගෙනෙයි**.** එයට ශෙල් අතුරු මුහුණතේ විවිධ කොටස් තෝරාගතහැකි අතර යතුරුපුවරුව හරහා පාලනය කල හැක**.** මෙය තවමත් සම්පූර්ණයෙන්ම ක්‍රියාකාරී නොවේ.




# අවලංගු කිරීම

Esc යතුර පහත ක්‍රියා අවලංගු කරයි:

- Alt+Tab
- Alt+F2
- මෙනු / කැලැන්ඩර
- දළ දැක්ම
- දළ දැක්ම තුළ සෙවීම
- කැඩපත

# වැඩතලය රෙකෝඩ් කිරීම

ඔබේ හන්තාන වැඩතලය වෙනත් මෘදුකාංග භාවිත නොකරම රෙකෝඩ් කළ හැක. උදාහරණයක් ලෙස ඔබට කිසියම් යෙදුමක් භාවිත කරන අයුරු පිළිබඳ විඩියෝවක් නිර්මාණය කිරීමට අවශ්‍ය නම් Control+Shift+Alt+R යන යතුරු සංයෝගය මහින් එය සක්‍රීය කර ගත හැක. රෙකෝඩ් කිරීම අවසන් වූ විට 'shell-%d%u-%c.webm' වැනි නමකින් ඔබේ නිවාස බහලුමෙ සුරැකෙනු ඇත. ගොනු නාමයේ %d යනු දිනය ද %u යනු ගොනු නාමය ඒකීය වීමට මුල පුරන වචනයක්ද %c යනු එක් සැසියක් තුළ දි රෙකෝඩ් කරන සෑම වාරයක් පාසාම ක්‍රමිකව වැඩි වන පූර්ණ අගයකි.

# යතුරු සංයෝග

GNOME ශෙල් ප්‍රතිචාර දක්වන සියළුම යතුරු සංයෝග පහත දැක්වේ

- පද්ධති යතුර (Windows) : දළ දැක්ම හා වැඩතලය අතර මාරුවීම
- Alt+F1: දළ දැක්ම හා වැඩතලය අතර මාරුවීම
- Alt+F2: පොප්-අප් විධාන සංවාදය
- Alt+Tab: පොප් අප් යෙදුම් මාරුව
- Alt+Shift+Tab: යෙදුම් මාරුවේදී ආපසු කැරකැවීම
- Alt+*[ටැබයට ඉහළ යතුර]*: Alt-Tab හි එකම යෙදුමේ කවුළු අතර මාරුවීමට
- Ctrl+Alt+Tab: පිවිසුම් සහායක මාරුව
- Ctrl+Shift+Alt+R: තිර විකාශන පටිගත කිරීම ආරම්භ/අවසන් කිරීමට
- Ctrl+Alt+Up/Down ඊතල යතුර: වැඩබිම් අතර මාරුවීමට
- Ctrl+Alt+Shift+Up/Down ඊතල යතුර: වත්මන් කවුළුව වෙනත් වැඩතලයකට ගෙනයෑමට
- Ctrl+Enter: නව අග්‍ර කවුළුවක ශෙල් විධානයක් ආරම්භ කිරීමට

තිරයේ දකුණු පස මෙනුව -> System Tools -> Keyboard -> Shortcuts හීදී බොහෝ යතුරු සංයෝග දැකගත හැක.